විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS
ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்க ஓய்வு
Sri Lanka Pensions
පරපුරක අභිමානය
தலைமுறையொன்றின் பெருமிதம்
Pride of a Generation

මගේ අංකය
எனது இல.
My No. ........................

ඔබේ අංකය
உமது இல.
Your No. ........................

දිනය
திகதி
Date 2015.06.30

විශ්‍රාම වැටුප් චක්‍රලේඛ ලිපි 05/2015

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්,
ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.

**මධ්‍යම දත්ත පද්ධතිය (Central Data Base ) හරහා විශ්‍රාම වැටුප් ගෙවීම් ආරම්භ කිරීම.**

උක්ත කරුණ සම්බන්ධයෙන් මාගේ සමාංක හා 2015.02.10, 2015.03.19 හා 2015.05.14 යන චක්‍රලේඛ ලිපි 1, 3, 4 ට අමතර වශයෙනි. ගෙවීම් ක්‍රියාවලිය තුල තවදුරටත් සිදුකරන ලද වැඩිදියුණු කිරීම් සමඟ 2015 ජූලි මස සිට විශ්‍රාම වැටුප් ගෙවීම් සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමුකරන මෙන් කාරුණිකව දන්වමි.

02. **මාසික විශ්‍රාම වැටුප් ගෙවීම්, මධ්‍යම දත්ත පද්ධතිය (Central Data Base )තුලින් ආරම්භ කිරීම**

මාසික විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලියට අදාල වන සියළුම ගෙවීම් කටයුතු මධ්‍යම දත්ත පද්ධතිය (Central Data Base ) හරහා පමණක් සිදුකරනු ලබයි. දැනට ඔබ _ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පවතින **"Access Data base " මින් ඉදිරියට භාවිතා නොකල යුතු අතර එය සුරක්ෂිතව (Backup සහිතව) පවත්වා ගෙන යාම ප්‍රමාණවත් වේ.** අවසන් වරට භාවිතා කල, 2015 ජුනි "Access Data Base " පිටපතක් (Backup) ලබාගෙන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත එවීමට කටයුතු කල යුතුය.

03. **බැංකු ගිණුම් අංක සංශෝධනය**

විශ්‍රාමිකයන්ගේ ඉල්ලීම මත හා වෙනත් හේතු මත බැංකු හා බැංකු ගිණුම් අංක මාරු කිරීම මධ්‍යම දත්ත පද්ධතිය හරහා සිදුකල හැක. එසේ සිදුකල නොහැකි විශේෂිත ගැටළු පවතී නම් ඒ බව ලිඛිතව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හරහා අප වෙත දැන්විය යුතුය.

මාළිගාවත්ත, කොළඹ 10. மாளிகாவத்தை கொழும்பு 10, Maligawatta, Colombo 10.
Hot line : 1970, Direct line : 2209800, Fax : 2342078, Email : info@pensions.gov.lk, web : www.pensions.gov.lk

04. මූලික වැටුප (Basic Pension) සංශෝධනය

වැටුප් සංශෝධන හේතු මත මූලික වැටුප වෙනස් කලයුතු අවස්ථාවලදී එය සංශෝධිත ප්‍රදාන පත්‍රයේ හෝ ප්‍රදාන පත්‍ර යේ පිටපතක් සමඟ පෙර වැටුප සහ සංශෝධිත වැටුප තහවුරු කර ආවරණ ලිපියක් සමඟ දෙපර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතුය. ඒ අනුව දෙපාර්තමේන්තුව මගින් මධ්‍යම දත්ත පද්ධතියේ මූලික වැටුප වෙනස් කරනු ඇත.

05. **C L A** (ජීවන වියදම් දීමනාව)

තවදුරටත් ජීවන වියදම් දීමනාව නිවැරදි විය යුතු අය සිටී නම් මධ්‍යම දත්ත පද්ධතියට පිවිස එය නිවැරදි කල යුතුය.හිඟ ගෙවීම් පවතී නම් ඒ බව ගණනය කිරීම් සහිතව AR Form සමඟ දැන්විය යුතුය.

06. **O T A** (වෙනත් දීමනා)

වෙනත් දීමනා නිවැරදිව තව දුරටත් සිදු නොවන්නේ නම් නිවැරදි අගය මධ්‍යම දත්ත පද්ධතියට පිවිස ඇතුලත් කිරීමට කටයුතු කල යුතුය. 2015 අයවැය යෝජනා අනුව වැඩි වූ දීමනා තවදුරටත් ගෙවා නොමැති නම් ජූලි මාසයේ ගෙවිය යුතු මුදල OTA (වෙනත් දීමනා යටතේ ) හිඟ ඇතුලත් කිරීමට කටයුතු කල යුතුය.

07. දස අවුරුදු සංශෝධන සිදුකිරීම

I ඔබ කාර්යාලයට අයිති දස අවුරුදු සම්පූර්ණවීම් මධ්‍යම දත්ත පද්ධතිය තුල පෙන්නුම් කරනු ලබයි එහි (unreduced) අඩු නොකල වැටුප නිවැරදිව ඇතුලත් කිරීම ප්‍රමාණවත් වේ.

II මෙම දස අවුරුදු සංශෝධන ප්‍රමාද වී ඇත්නම් හෝ මධ්‍යම දත්ත පද්ධතිය තුල එය නොපෙන්වයි නම් ඒ පිළිබඳව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පහත ආකෘති පත්‍රය අනුව තොරතුරු ලබාදිය යුතුය. ඉන්පසු විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් එය මධ්‍යම දත්ත පද්ධතියට ඇතුලත් කිරීමට කටයුතු කරනු ලැබේ.

**දස අවුරුදු සංශෝධන ලේඛනය**

දිස්ත්‍රික්කය :- District Code :- ප්‍රා.ලේ.කාර්යාලය :- D.S Code :-

| Code | Pension Type | Pension No: | Name | Retired Date | දැනට ගෙවන වැටුප | ජූලි මස සිට ගෙවිය යුතු වැටුප (දස අවුරුදු ඉවත්කිරීම් සිදුකල පසු) | ගෙවිය යුතු හිඟ වැටුප |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

සකස් කලේ :- පරීක්ෂා කලේ :- අනුමත කිරීම :- සහතික කිරීම :-

**08 . විශ්‍රාමිකයින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ අතර මාරුවීම**

මෙහිදී දැනට විශ්‍රාම වැටුප් ලබා ගන්නා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සිට වෙනත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ස්ථිර පදිංචියට යෑම මත විශ්‍රාම වැටුප් ලිපිගොනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල අතර මාරු කර යැවීම අවශ්‍ය නොවේ. එම වෙනස්වීම් තොරතුරු මධ්‍යම දත්ත පද්ධතියට පිවිස සිදුකල යුතුය. එම වෙනස්වීම් තත්වය අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල අතර e-mail මගින් තහවුරු කර ගත යුතුය. ප්‍රාදේශීය ලේකම් කාර්යාල අතර මාරුවීම් දත්ත පද්ධතියේ නිරූපනය වන අතර, **ඒ පිළිබඳ අවධානයෙන් කටයුතු කල යුතු වේ.**

**09. විශ්‍රාමිකයන් මිය යෑම හා වෙනත් හේතු මත විශ්‍රාම වැටුප් නැවැත්වීම**

මෙවැනි අවස්ථාවල මධ්‍යම දත්ත පද්ධතියට පිවිස අදාල විශ්‍රාම වැටුප් නැවැත්වීමට වහාම කටයුතු කලයුතුයි.

**10. විශ්‍රාම වැටුපෙන් සිදුකරනු ලබන අඩු කිරීම් ( Deduction සිදු කිරීම )**

දැනටමත් මෙම තත්වය මධ්‍යම දත්ත පද්ධතිය මගින් සිදුකිරීමට පහසුකම් සලසා ඇත. තවදුරටත් නිවැරදි විය යුතු අඩුකිරීම් පවතී නම් ඔබ විසින් එය සකස් කල යුතුය. එසේම සෑම අඩුකිරීමක්ම (Deduction) පැහැදිලිව හඳුනාගත හැකි පරිදි අදාල නිශ්චිත කෙටි නම ඊට ඇතුලත් කර පැවතිය යුතුයි.

| | | | |
|---|---|---|---|
| උදා: | GOBA | - | රාජ්‍ය සේවා යහසාධක සංගමය |
| | PSMPA | - | රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය අර්ථසාධක සංගමය |
| | PSPTF | - | රාජ්‍ය සේවා විශ්‍රාමික භාර අරමුදල |

මේ පිළිබඳ යම් ගැටළුකාරී තත්වයක් පවතී නම් එය ලිඛිතව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබාදීමට කටයුතු කල යුතුය.

11. 2015 ජුලි මස සිට GOBA, PSMPA, PSPTF, යන සංගම් සඳහා අඩුකිරීම් දෙපාර්තමේන්තු මධ්‍යම දත්ත පද්ධතිය තුළින් සෘජුවම අඩුකර අදාල ආයතන වෙත යැවීමට කටයුතු කරනු ලැබේ. එබැවින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් මෙම ආයතන සඳහා චෙක්පත් ලිවීම අවශ්‍ය නොවේ. ඊට අමතරව අනෙකුත් Deduction සඳහා පෙර පරිදිම චෙක්පත් යැවීමට කටයුතු කල යුතුය.

**12. මූලාශ්‍ර ලේඛන ( Source Document ) එවීමේදී අනුගමනය කල යුතු ක්‍රියා මාර්ග පහත පරිදි වෙන් වෙන් වශයෙන් හඳුනාගත හැකි පරිදි එවීමට කටයුතු කල යුතුය.**

I. 2014/10/01 ට පෙර විශ්‍රාම ගිය සිවිල් (Civil) ප්‍රථම ගෙවීම් ආරම්භය
II. වැන්දඹු අනත්දරු ප්‍රථම ගෙවීම( W&op) ආරම්භය
III. වැටුප් ගෙවීම් නවතා තබා නැවත ආරම්භ කිරීම,එහිදි අදාළ හේතුව පැහැදිලිව ලිවිය යුතුයි.උදා :-

(විදේශ ගතවී නැවත පැමිණීම, පදිංචි සහතික නොදීම මත, මාරුකිරීම් මත -( තවදුරටත් පවතී නම්), වෙනත් විශේෂිත හේතු මත වැටුප් ගෙවීම නවතා තැබීම

මේ සමග හිඟ ගණනය කිරීම් වලට අදාල AR අමුණා එවිය යුතු අතර රු. 500,000/- ට වැඩි ගෙවීම් සඳහා අදාල ලිපිගොනුව එවිය යුතුය.

13. පසුගිය මාසවල විශ්‍රාම වැටුප් ගෙවීම් ගැටළු

විශ්‍රාම වැටුප් නොගෙවීම,වැටුප අඩු වැඩිවීම,ජීවන වියදම් දීමනාව අඩුවීම වැඩිවීම,වෙනත් දීමනා අඩුවීම වැඩිවීම,හිඟ ගෙවීම් සහ තවදුරටත් විසඳී නොමැතිව ගැටළු පවතී නම් ඒ බව ලිඛිතව පැහැදිලිව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබාදිය යුතුය.

14. විශ්‍රාම වැටුප් ගෙවීමට අදාලව තොරතුරු ඉදිරිපත් කරන සෑම අවස්ථාවකම පහත මූලික තොරතුරු සමඟ එය ඉදිරිපත් කිරීම අත්‍යාවශ්‍ය වේ.

**දිස්ත්‍රික්කයේ නම :** **District Code :** **ප්‍රා.ලේ.කාර්යාලය :** **D.S Code :**

| Pension Code | Pension Type | Pension No | Name | Bank | Branch | Account No. |
|---|---|---|---|---|---|---|

15. මාසික විශ්‍රාම වැටුප් ගෙවීමට අදාල Source Document හා වෙනත් හිඟ ගෙවීම්( AR Form) වලට අදාළ වන සියලු ලිපිලේඛණ තොරතුරු දිස්ත්‍රික් ලේකම් මගින් ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු අතර තැපැල් මගින් එවීම සිදු නොකල යුතුය. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඒවා නිවැරදිව පරීක්ෂා කර ක්‍රමානුකූල පිළිවෙලකට සකස්කර ඉදිරිපත් කල යුතුයි.

16. යම් කිසි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මධ්‍යම දත්ත පද්ධතියට පිවිස කටයුතු කිරීම සඳහා අවශ්‍ය පහසුකම් නොමැති නම් එම පහසුකම් ලබාදෙන තෙක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට පැමිණ අවශ්‍ය පහසුකම් ලබාගැනීමට කටයුතු කල යුතුය.

එස්.එස්. හෙට්ටිආරච්චි
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් : 1. ලේකම් - රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශය
2. ලේකම් - මුදල් අමාත්‍යාංශය
3. විගණකාධිපති - විගණකාධිපති දෙපාර්තමේන්තුව
4. ප්‍රධාන අභ්‍යන්තර විගණක - විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව